ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
MINISTRY OF DIGITAL ECONOMY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி, சுஹுருபாய, ஸ்ரீ சுபூதிபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. } DRP/OP/21/15/01

ඔබේ අංකය / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2026.04. 09

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු**
**චක්‍රලේඛ : 01/2026**

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>උප්පැන්න සහතිකයක් නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ජාතික හැඳුනුම්පත් ලබා දීම.</u>**

උප්පැන්න සහතිකයක් නොමැති වීමේ හේතුව මත මෙතෙක් ජාතික හැඳුනුම්පත ලබා ගැනීමට නොහැකි වූ, වයස අවුරුදු 50 ඉක්ම වූ, ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පුද්ගලයන්ට මෙම චක්‍රලේඛයේ දැක්වෙන පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, ජාතික හැඳුනුම්පත ඉල්ලුම් කිරීම සඳහා යොමු කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

02. ඒ අනුව, යම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක ස්ථිර පදිංචිය සහිත, ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි, උප්පැන්න සහතිකයක් නොමැති වීම හේතුවෙන් මෙතෙක් ජාතික හැඳුනුම්පතක් ලබාගෙන නොමැති, වයස අවුරුදු 50 ඉක්ම වූ ශ්‍රී ලාංකික පුරවැසියන් මේ සඳහා ඉල්ලුම් කළ යුතුය. ඒ සඳහා පහත උපදෙස් අනුව කටයුතු කරමින් අදාළ ලියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

I. පු.ලි.දෙ.වි. 1,7,8 ඉල්ලුම්පත
II. පු.ලි.දෙ/මෙ/03/01 ප්‍රකාශය
III. නම, ලිපිනය, උපන් දිනය, උපන් ස්ථානය, ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් බව සඳහන් දිවුරුම් ප්‍රකාශයක්
IV. පු.ලි.දෙ/මෙ/02/03 ප්‍රකාශය (නියමිත දඩ මුදල් ගෙවා ලබාගත් ලදුපත සමඟ)
V. උපත ලියාපදිංචිව නොමැති බවට අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරනු ලබන හිස් ප්‍රතිඵල ලේඛනය සමග නම හා උපන් දිනය සනාථ කිරීමට ලිඛිත සාක්ෂි ලෙස පිළිගත හැකි පහත සඳහන් **එක් ලේඛනයක්**

   a. දරුවන් සිටීනම් ඔවුන්ගේ උප්පැන්න සහතික
   b. පාසල් හැර යාමේ සහතිකය
   c. වැඩිහිටි හැඳුනුම්පත
   d. වතු උපත් ලේඛනය හෝ වතු හැරයාමේ සහතිකය
   e. උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි වාසය කරන ලද පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා නිකුත් කර ඇති විශේෂ / තාවකාලික හැඳුනුම්පත
   f. එම පවුල් සඳහා (ඉහත e හි සඳහන්) නිකුත් කර ඇති පවුලේ විස්තර සඳහන් පවුල් කාඩ්පත
   g. වලංගු ගමන් බලපත්‍රය
   h. වලංගු රියදුරු බලපත්‍රය
   i. විවාහ සහතිකය
   j. හඳුනා ගැනීම සඳහා නිකුත් කර ඇති පිළිගත් ආයතනයක අනන්‍යතා පත්‍රය

දුරකථන / தொலைபேசி / Telephone } (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax } (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail } info@drp.lk
වෙබ් / இணையதளம் / Web } www.drp.gov.lk

Circular ncbe

k. උපන් අවස්ථාවේදී සාම්ප්‍රදායිකව සකසනු ලබන හඳහන/ කේන්ද්‍රය/ වේලාපත්කඩයේ ප්‍රාදේශීය ලේකම් හෝ බලය පැවරූ නිලධාරියා විසින් සහතික කළ ඡායා පිටපත

03. නම හා උපන් දිනය තහවුරු කරගත හැකි ඉහත සඳහන් කර ඇති කිසිදු ලේඛනයක් ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවක දී, ඉල්ලුම්කරුගේ නම, උපන් දිනය, උපන් ස්ථානය හා ලිපිනය ඇතුළත් කර ග්‍රාම නිලධාරී විසින් සකස් කරන ලද වාර්තාවක් ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, අදාළ පුද්ගලයාගේ ප්‍රකාශයක් ද සමඟ ඉදිරිපත් කළ හැකි ය.

04. එමෙන්ම පු.ලි.දෙ/මෙ/03/01 ප්‍රකාශයේ 05 ඡේදය යටතේ සඳහන් ජාතික හැඳුනුම්පතක් හිමි ඉල්ලුම්කරුගේ ළඟම ඥාතීන් පිළිබඳ විස්තර සහ ඉල්ලුම්කරුගේ අනෙකුත් විස්තර, ජාතික හැඳුනුම්පතක් හිමි සාක්ෂිකරුවන් තිදෙනෙකු විසින් සහතික කිරීම අනිවාර්යය වේ.

05. යම් පුද්ගලයෙකුට තමා උපන් ප්‍රදේශයට ගොස් හිස් ප්‍රතිඵල ලේඛනය ලබා ගැනීමේ අපහසුවක් පවතී නම් එම ලේඛන ලබා ගැනීම සඳහා තමන් දැනට පදිංචි ප්‍රදේශයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙතින් තමා උපන් ප්‍රදේශයට අයත් අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත අදාළ ඉල්ලීම සමඟ අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර හිස් ප්‍රතිඵල ලේඛනය ලබා ගැනීමට කටයුතු කළ හැකි ය.

06. තවද, වයස <u>අවුරුදු 50 නොඉක්ම වූ</u> උප්පැන්න සහතිකයක් නොමැති පුරවැසියන්ට අනුමාන වයස් සහතිකය හෝ දරුකමට හදාගැනීමේ සහතිකය සමඟ උපන්දිනය සනාථ කළ හැකි පහත සඳහන් ලේඛන අතරින් එක් ලේඛනයක් ඉදිරිපත් කරමින් ජාතික හැඳුනුම්පත ලබා ගැනීමට ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට ද හැකියාව ඇත. එසේ වුවත් අනුමාන වයස් සහතිකයේ උපන්දිනය සඳහන් නොවන්නේ නම් පහත සඳහන් ලේඛන අතරින් එක් ලේඛනයක් සමඟ නම, උපන් දිනය හා උපන් ස්ථානය සඳහන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.

a. දරුවකුගේ උප්පැන්න සහතිකය
b. පාසල් හැරයාමේ සහතිකය
c. සෞඛ්‍ය වර්ධන සටහන
d. වතු උපත් ලේඛනය

07. මෙමගින් ලබා දෙන සහනය උපයෝගී කරගෙන ශ්‍රී ලාංකික පුරවැසියෙකු නොවන තැනැත්තකු, උප්පැන්න සහතිකයක් හිමි අයෙකු හෝ දැනටමත් ජාතික හැඳුනුම්පතක් ලබා ගෙන ඇති පුද්ගලයෙකු නැවත ජාතික හැඳුනුම්පතක් ලබා ගැනීමට ඉල්ලුම් නොකරන බව තහවුරු කර ගැනීමටත් ඇතැම් වංචනික පුද්ගලයන් විසින් තමන්ගේ අනන්‍යතාවය පිළිබඳව තොරතුරු සඟවා නව අනන්‍යතාවයක් ලබා ගැනීමට ඇති ඉඩකඩ වැළැක්වීමටත් ඔබගේ අවධානය යොමු කරන ලෙසත්, ඒ පිළිබඳව සියලුම ග්‍රාම නිලධාරීන්ගේ විශේෂ අවධානය ද යොමු කරවන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

**එම්.එස්.පී.සූරියප්පෙරුම**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් (වැ.බ.)

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | ලේකම්, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස. |
| 02. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - කරු.දැ.ගැ.ස. |
| 03. | රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස. |
| 04. | විගණකාධිපති | - කරු.දැ.ගැ.ස. |
| 05. | සියලුම මාණ්ඩලික නිලධාරීන් (පු.ලි.දෙ.) | - කරු.දැ.ගැ.ස. සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා |
| 06. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත පු. ලි.දෙ. සංවර්ධන නිලධාරීන් | - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස. |